# බලන්ගොඩ නගර සභාව

## 2019-03-12 දින මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.03.12**

**වේලාව - පෙ.ව. 10.00**

**බලන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනී | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනී | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම**

2019-03-12 වන දින මාසික මහසභාවේ වැඩකටයුතු ආරම්භ කල ගරු උප සභාපතිතුමන් විසින්, 2019.02.12 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් 2019.02.12 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙම වාර්තාවන්හි සංශෝධන තිබේදැයි ගරු උප සභාපතිතුමන් විසින් විමසා සිටි අවස්ථාවේදි , පිළිතුරු ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් 2019.02.12 දිනැති සභා වාර්තාවේ සංශෝධනයන් ලෙස,

**02 වන පිටුව අංක 01 යටතේ,**
නාගරික සංවර්ධන අධිකාරියට ගැසට් කරන ලද නගර සභාවක් බවට ඇතුළත් විය යුතු බවටත්,

**09 වන පිටුව 05:01:02 යටතේ,**
අපේක්ෂකයන් යන්න පාළිකාවන් ලෙස වෙනස් විය යුතු බවත්,

**10 වන පිටුව 05:01:04 යටතේ,**
ආයතන යන්න වෙළෙඳ ආයතන ලෙස වෙනස් විය යුතු බවත්,

**25 වන පිටුව 06:09 යටතේ,**
විවෘත ශීතකරනවල ගබඩා කිරීම යන්න විවෘත ශීතකරනවල ප්‍රදර්ශනය කිරීම ලෙස වෙනස් විය යුතු බවත්, පවසා සිටින ලද අතර එම කරුණු සංශෝධන සඳහා ඇතුළත් කරන ලදී.

**02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන**

ගරු උප සභාපතිතුමන් විසින් මෙහිදී නිවේදන ආරම්භ කරමින් ගරු සභාපතිතුමන් අසනීප තත්වය හේතුවෙන් මෙදින සභාව වෙත වාර්තා නොකල බව පවසා සිටින ලදී.

**03. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

***03:01 අනුමත සැලසුම් සඳහා අනුකූලතා සහතික ලබාදීම.***

අනුමත සැලසුම් සඳහා අනුකූලතා සහතික ලබාදීමේ කාලය දීර්ඝකරන මෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත කරන ලද ඉල්ලීමට පිළිතුරු වශයෙන් එවා ඇති ලිපිය ගරු

සභාවට ඉදිරිපත් කල ගරු උප සභාපතිතුමන් විසින්, එම ලිපියේ සඳහන් පරිදි බලපත්‍රයේ වලංගු කාලය වසර 3 බලාත්මක වී ඇත්තේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 ඒ වගන්තිය අනුව වන අතර මේ සඳහා යම් වෙනසක් කරන්නේ නම් එය පනතට අදාළව එම පනතේ සංශෝධනයක් ලෙස සකස් විය යුතු බවත් පවසා සිටින ලදී.

***03:02 ගරාජයෙන් සිදුවන පරිසර හානිය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් එවන ලද ලිපිය සම්බන්ධයෙන් සභාව දැනුවත් කිරීම.***

පී.බී.සරත්චන්ද්‍ර මහතා විසින් සේනක පෙදෙසේ පවත්වාගෙන යන ගරාජය සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය දැනුවත් කර යවන ලද ලිපියට එම ආයතනය මගින් එවා ඇති පිළිතුරු ලිපිය ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව මෙම ගරාජය සම්බන්ධයෙන් සිදු කරන ලද ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂනයේදී නිරීක්ෂණය කරන ලද කරුණු සලකා ගරාජයේ හිමිකරු විසින් සපුරාලිය යුතු ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කර ඇති බව වැඩිදුරටත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් පරිසර අධිකාරියෙන් අනුමැතිය දුන්නද වෙළෙඳ බලපත්‍රය ලබාදෙන්නේ නගර සභාව මගින් බැවින් මේ සම්බන්ධව සොයා බැලීම නගර සභාව සතු වගකීමක් වන අතරම,මෙහි තිබෙන්නේ පරිසර ප්‍රශ්නයක් නොව මහජනතාවට පීඩාවන පරිදි ඇති වී ඇති දැඩි දුගඳකාරී තත්වය බවත් වෙළෙඳ බලපත්‍රය අවලංගු කිරීම සභාව සතු කාර්යය බවත් අවම වශයෙන් සතියක කාලයක්වත් මහජන සෞඛ්‍යය පරීක්ෂක විසින් මේ සම්බන්ධව අධීක්ෂණය කරන ලෙසත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් අදහස් දක්වමින් මෙහි අයිතිකරු මෙම ව්‍යාපාරය වෙනත් ස්ථානයක් කරා ගෙන යාමට කැමැත්තෙන් සිටින බැවින් මෙම ව්‍යාපාර කටයුතු කඩාකප්පල් නොකර,ව්‍යාපාරිකයා රැකගෙන, ව්‍යාපාරය නියමාකාර ස්ථානයකට යොමුකිරීමට සභාව උත්සුක විය යුතු බවත් එසේ නොවුනහොත් ඉදිරියේදි ගැටුම්කාරි තත්වයක් උද්ගත විය හැකි බවත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා විසින් පරිසර අමාත්‍යාංශය විසින් ව්‍යාපාරිකයා දෙස මානුෂික හැඟීමෙන් බලා පරිසර බලපත්‍ර ලබාදෙන

බවත්,මෙහිදී ව්‍යාපාරිකයා සමඟ එකඟත්වයට පත්ව ව්‍යාපාරය වෙනත් සුදුසු ස්ථානයකට ගෙනයාමට අවශ්‍ය කටයුතු කිරීම සුදුසු බවත් පවසා සිටින ලදී.

සභාව කඩිනමින් මැදිහත්වී මේ සම්බන්ධව තීරණයක් ගැනීමට ක්‍රියාකල යුතුබව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් මෙහිදී පවසා සිටින ලදී.

***03:03 වතුකාරගොඩ ගමේ පවුල් 10 ක් පමණ නගර සභාව වෙත වරිපනම් බදු ගෙවු නමුත්,ඡන්දය ප්‍රාදේශිය සභාව වෙත බලපැවැත්වීම.***

වතුකාරගොඩ ගමේ පවුල් 10 ක් පමණ නගර සභාව වෙත වරිපනම් බදු ගෙවු නමුත්,ඡන්දය ප්‍රාදේශිය සභාව වෙත බලපැවැත්වෙන බැවින් එම ඡන්දය නිවැරදි කර දෙන මෙන් ඉල්ලා අදාළ ගම්වැසියන් විසින් කරන ලද ඉල්ලීම සභාව වෙත යොමුකරන ලද ගරු උප සභාපතිතුමන් විසින් කඩිනමින් මේ සම්බන්ධව ග්‍රාම නිළධාරින් මගින් මැතිවරණ කොමසාරිස් දැනුවත් කර,අදාල සාමාජිකයන් නගර සභා සීමාවේ ඡන්ද නාම ලේඛනයට ඇතුළු කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට එකඟත්වය පල කරන ලදී.

**04. *04:01* කල් දී ඇති යෝජනා**

***ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා***

**04:01:01 2018 මූල්‍ය ප්‍රකාශයට සභා අනුමැතිය ලබාගැනීම.**

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බලංගොඩ නගර සභාවේ මූල්‍ය ප්‍රකාශය ශ්‍රි ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතවලට අනුව සකස් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් 2018 වර්ෂයේදි එක් කොට්ඨාශයකට ලක්ෂ 10 බැගින් මුදල් ප්‍රතිපදාන ලබාදෙන බව පැවසූ තොරතුරු මෙහි කොට්ඨාශ වශයෙන් අන්තර්ගත කර තිබේද යන්න විමසා සිටින ලදී.

ඒ සඳහා පිළිතුරු ලබාදීමට ගණකාධිකාරි සභාවට කැඳවීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි

මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.ගණකාධිකාරි විසින් මේ පිළිබඳ ගරු සභාව දැනුවත් කිරීමෙන් පසුව ගරු සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බලංගොඩ නගර සභාවේ මූල්‍ය ප්‍රකාශය අනුමත කිරීම සඳහා යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා නොමැති හෙයින් එම යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04.01.02 බැංකියවත්ත අපජල පෙරණය සෑදීම සඳහා නර්ඩ් ආයතනයෙන් හෝ අයිටීඅයි ආයතනයෙන් උපදෙස් ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගැනීම**

බැංකියවත්ත අපජල පෙරණය සෑදීම සඳහා සභාව සතුව තාක්ෂණය නොමැති කම නිසා, ඒ සඳහා නර්ඩ් ආයතනයෙන් හෝ අයි ටී අයි ආයතනයෙන් උපදෙස් ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.
මේ සඳහා සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ සභාවේ ඒකමතිකව සම්මත විය.

**04.01.03 - 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි සහ අපහරණ වාර්තාව සඳහා අනුමැතිය ලබාගැනීම.**

2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි සහ අපහරණ වාර්තාවට අනුව 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් එය ස්ථිර කරන ලදී.
මේ සඳහා සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:04 මැයි මස හෝ ජූනි මස පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම - කොමර්ෂල් බැංකුව ඉදිරිපිට**

පුස්තකාල උපදේශන කමිටුවේ සාකච්ඡා කරන ලද පරිදි කොමර්ෂල් බැංකුව ඉදිරිපිට මැයි මස හෝ ජූනි මස පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා වූ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:05 පුස්තකාලය නැරඹීමේ නිරීක්ෂණ චාරිකාව**

පුස්තකාල උපදේශන කමිටුවේ සාකච්ඡා කරන ලද පරිදි මීනුවන්ගොඩ මහජන පුස්තකාලය නැරඹීමේ නිරීක්ෂණ චාරිකාව සඳහා සහභාගී වීමට සභාවේ අනුමැතිය පතමින් ඉදිරිපත්කරන ලද ලිපිය සමග යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් එය ස්ථිර කරන ලදී.

මේ සඳහා සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:06 පුස්තකාලය සඳහා ඉදිරි අවු. 50 ක ඉලක්කයක් තබා ඉහළ අධිකාරිය සමග සාකච්ඡා කර Master Plan එකක් සාදා ගැනීම**

පුස්තකාලයේ ඉදිරි අවු. 50 ක ඉලක්කයක් තබා ඉහළ අධිකාරිය සමග සාකච්ඡා කර Master Plan එකක් සාදා ගැනීම සඳහා වූ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමන් විසින් පුස්තකාල උපදේශන කමිටුවේ සාකච්ඡා කරන ලද පරිදි ඉදිරි වර්ෂ 50 ක ඉලක්කයකට අනුව නව ගොඩනැගිල්ලක් සකස් කිරීම පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලද බව පවසා සිටින ලදී.

මේ සඳහා සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:07 පුස්තකාලය සඳහා නව ගොඩනැගිල්ලට සැලැස්මක් සාදා අන්තර්ජාලයට මුදාහැර සම්පත් දායකයන් සොයාගැනීම.**

පුස්තකාලය සඳහා නව ගොඩනැගිල්ලට සැලැස්මක් සාදා අන්තර්ජාලයට මුදාහැර සම්පත් දායකයන් සොයාගැනීම සඳහා වූ යෝජනාව ගරුඋප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදි ගරු නාගරික මන්ත්‍රි කේ.පී.පේමදාස මැතිතුමන් විසින් අදහස් දක්වමින් මේ පිළිබඳව පුස්තකාල උපදේශන කමිටුවේදි සාකච්ඡා කල පරිදි ,පුස්තකාලය සඳහා ඉදිකිරීමට නියමිත නව ගොඩනැගිල්ල සඳහා සැලැස්මක් සකස් කිරීමටත්,පසුව මහජන ආධාර ලබාගැනීමේ අරමුණින් එය අන්තර්ජාලය වෙත මුදා හැර ආධාර ලබා ගැනීමටත් මෙහිදී අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් මෙම ගොඩනැගිල්ල සඳහා සැලසුම් සකස් කිරීමේදි ඒ සඳහා මුදල් වැය නොකොට නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය වෙත ඉල්ලීමක් කොට නොමිළයේ සැලැස්ම සකස් කර ගැනීමට උත්සුක වීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

**04:01:08 ශාඛා පුස්තකාල ඇතිකිරීම**

නගර සභා මහජන පුස්තකාලයේ ශාඛා පුස්තකාල ලෙස බෝම්බුව හා අනඳමෙත්ගම ප්‍රදේශයන්හි පුස්තකාල ආරමභ කිරීම සඳහා වූ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:09 ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ දුරකථන දීමනාව, දීමනාවක් වශයෙන් ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගැනීම**

ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ දුරකථන දීමනාව, දීමනාවක් වශයෙන් ලබාගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව සභාවේ අනුමත කර ගත් පසුව ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමන් විසින් වැඩිදුරටත් අදහස් දක්වමින් පවසා සිටින ලදී.
විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:10 සභාව සතු ස්ථාවර වත්කම් තක්සේරු කර ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීම**

සභාව සතු ස්ථාවර වත්කම් තක්සේරු කර ගැනීම හා ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමේදි නගර සභාව සතු ඉඩම්වල මැනීම් කටයුතු සිදුකර, බිම් කට්ටි සැලැස්ම හා ඔප්පු ලබාගැනීමට සභාවේ අනුමැතිය පතමින් ගරු උප සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:11 විවිධ අත්තිකාරම් කපාහැරීම සඳහා අනුමැතිය ලබාගැනීම**

විවිධ අත්තිකාරම් කපාහැරීම සඳහා සභාවේ අනුමැතිය ලබාගැනීමට ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදි මෙලෙස කපා හරින අත්තිකාරම් පිළිබඳව සභාව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමන් විසින්, එම කපා හරින අත්තිකාරම් පිළිබඳ ලේඛනයක් ලබාදෙන ලෙස වැඩිදුරටත් පවසා සිටින ලදී.

මෙහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන්ගේ ස්තිරත්වයෙන් සභාව කාරක සභාවක් බවට පත් කල අතර ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් පසුව මෙහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත මහ සභාවක් බවට පත් කරන ලදී.

මේ සඳහා සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**හදිසි යෝජනා**

**04:02:01 නිවාඩු අනුමත කිරීම. - ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා, අසනීප තත්වය හේතුවෙන් අද දින සභවෙ වෙත නොපැමිණි බව පැවසූ ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් එතුමාට හිමි නිවාඩු අනුමත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.
මේ සඳහා සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:02 වැසිකිළි ආධාර ලබා දීමේ නාම ලේඛනය සඳහා අනුමැතිය ලබා ගැනීම**

නගර සභා සෞඛ්‍යය අංශය වෙත ලබාදී ඇති ඉල්ලීම් සලකා 2018 වර්ෂයේ අඩු ආදයම් ලාභීන් 20 දෙනෙකු සඳහා එක් අයෙකුට රු.10,000.00 බැගින් 20 දෙනෙකු සඳහා රු.200,000.00 ක මුදලක් වැසිකිළි ආධාර ලබා දීමට සුදුසු යයි සකස්කරන ලද නාම ලේඛනය සහිත යෝජනාව ගරුඋප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා සභාවේ **විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04:02:03 විශ්ව විද්‍යාල සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීමේ නාම ලේඛන ඉදිරිපත් කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

විශ්ව විද්‍යාල සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීමේ අයදුම්පත්‍ර සලකා බලා 2018 වර්ෂයේ අයදුම්පත්‍ර ලබාදුන් අයදුම්කරුවන් 39 දෙනෙකු සඳහා එක් අයෙකුට රුපියල් 5,000.00 බැගින් රු.195,000.00 ක මුදලක් ලබාදීමට සුදුසු යයි සකස්කරන ලද නාම ලේඛනය සහිත යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා සභාවේ **විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04፥02፥04 ඇල්ලෙපොළ සරස්වතී මාර්ගයේ පොදු සුසාන භූමියේ කපන ලද ගස්වල කඳන් සම්බන්ධ තීරණයක් ගැනීම.**

ඇල්ලෙපොළ සරස්වතී මාර්ගයේ පොදු සුසාන භූමියේ කපන ලද ගස්වල කඳන් සම්බන්ධ තීරණයක් ගැනීම සඳහා වූ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් කපන ලද ගස්වල කඳන් ඉරා ලෑලි ලබා ගැනීමටත්, ඉතිරි ද්‍රව්‍යය ප්‍රිමික්ස් සෑදීම සඳහා බැංකියවත්ත වෙත ලබාදීම සුදුසු බවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව **විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04፥02፥05 මූකලන්වත්ත මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම**

මූකලන්වත්ත මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු උප සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වැඩ අධිකාරි හා කාර්මික නිළධාරි වාර්තාවක් ලබාගත් පසු ඉදිරි කටයුතු ආරම්භ කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

මේ සඳහා සභාවේ **විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04፥02፥06 2019 සිංහල,දමිල අළුත් අවුරුද්ද උත්සව සමයෙ කොවුල් හඬ ශබ්ද විකාශනය යන්ත්‍රය සඳහා සභා අනුමැතිය ගැනීම.**

2019 සිංහල,දමිල අළුත් අවුරුදු උත්සව සමයේ කොවුල් හඬ ශබ්ද විකාශනය යන්ත්‍රය සඳහා සභා අනුමැතිය ගැනීම සඳහා වූ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අකිළ සාළිය එල්ලාවල මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

සභාවෙන් පනවන ලද කොන්දේසිවලට අනුකූලව බලපත්‍ර ගාස්තු අයකරගෙන මේ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බව මෙහිදී සභාවේ සාකච්ඡා කරන ලද අතර, **විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04:02:07 කසළ එක්රැස් කිරීමේ ටෙන්ඩරයේ කටයුතු ප්‍රතික්ෂේප කිරීම.**

**ආර්.කේ.ජයසුන්දර**

කසළ එක්රැස් කිරීමේ ටෙන්ඩරයේ, ටෙන්ඩර්කරු වන ආර්.කේ.ජයසුන්දර මහතා ටෙන්ඩරයේ කටයුතු පවත්වා ගෙන යාමට අපහසු බව පවසා ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඒ සම්බන්ධ ඉදිරි වැඩ කටයුතු කරගෙන යාම සඳහා සුදුසු පියවරක් ගැනීම සම්බන්ධයෙන් වූ යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙහිදි ගරු උප සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභාවක් බවට පත්කල අතර මේ සම්බන්ධව ටෙන්ඩර්කරු ගෙන්වා සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කරන ලදී.

ඒ අනුව සභාවේ සාකච්ඡා කොටගත් පරිදි දෛනිකව මුදල් ගෙවීමේ පදනම මත කසළ එක්රැස් කිරීමේ කටයුතු සභාව මගින් සිදු කිරීම සුදුසු බවට හා ඒ සඳහා අවශ්‍ය කම්කරුවන් බාහිරින් සපයා ගැනීම සඳහා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා සභාවේ **විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 05. මන්ත්‍රී යෝජනා

***05:01 ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය***

05:01:01 සුදර්ශනගම ඉහළ මාර්ගයේ පලුදු වූ ස්ථාන නැවත යථා තත්ත්වයට පත් කර ගැනීම

05:01:02 හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයේ කාණු පද්ධතිය නැවත යථා තත්ත්වයට පත් කිරීම

05:01:03 සුදර්ශනගම ඉහළ මාර්ගයේ 1 වන පටුමග ඉදිකරන ලද බැම්මේ ඉතිරිව ඇති කොටසින් විශාල ජල පහරක් ගලා බැසීමෙන් පහළ නිවෙස් වලට අවදානමක් පවතින බැවින් එම ජල මාර්ගය නිසි පරිදි ගලා යාමට කටයුතු සලසා ගැනීම

ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් සුදර්ශනගම ඉහළ මාර්ගයේ පලුදු වූ ස්ථාන නැවත යථා තත්ත්වයට පත් කර ගැනීමේ යෝජනාව සම්බන්ධයෙන් කිහිප වතාවක් සභාවේ කරුණු දැක්වුවද මේවන තෙක් කිසිඳු සංවර්ධනයක් ඉටු නොවූ බව පවසා සිටි අතර මේ පිළිබඳව කර්මාන්ත කමිටුව වෙතද දන්වූ බව පවසා සිටින ලදී.එමෙන්ම හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයේ කාණු පද්ධතිය නැවත යථා තත්ත්වයට පත් කිරීමේ යෝජනාව සම්බන්ධයෙන්ද අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය එම කටයුතු කඩිනමින් ඉටුකර දෙන ලෙසත්, මෙතෙක් එම ස්ථානයන්හි කරනලද අළුත්වැඩියාවන් සම්බන්ධව කිසිඳු සෑහිමකට පත්විය නොහැකි බවත් පවසා සිටින ලදී.

එමෙන්ම සුදර්ශනගම ඉහළ මාර්ගයේ 1 වන පටුමග ඉදිකරන ලද බැම්මේ ඉතිරිව ඇති කොටසින් විශාල ජල පහරක් ගලා බැසීමෙන් පහළ නිවෙස් වලට අවදානමක් පවතින බැවින් එම ජල මාර්ගය නිසි පරිදි ගලා යාම සඳහා බැම්මේ ඉතිරි කොටස නිසියාකාරව නිමා කර දෙන මෙන් මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉල්ලා සිටින ලදී.
සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:02 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා***

05ඃ02ඃ01 බුද්ධ ජයන්ති මාවතේ ශ්‍රීපාලි ආයතනය පිහිටි පාරේ ඩෙංගු බෝවන ස්ථානයක්ව පවතින කාණු පද්ධතිය ක්‍රමවත් ලෙස ඉදිකිරීම

05ඃ02ඃ02 ඕලුගංතොට සුගත් කඩේ අසල ඇති කාණු පද්ධතිය පවිත්‍රකර දීම

05ඃ02ඃ03 සුදර්ශනගම මාර්ගය තාර යොදා පිළිසකර කරදීම

05ඃ02ඃ04 හුණුකුඹුර දෙල්ගස්වත්ත මාර්ගයේ අබලන් වී ඇති කොටස් පිළිසකර කිරීම

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින්, බුද්ධ ජයන්ති මාවතේ ශ්‍රීපාලි ආයතනය පිහිටි පාරේ ඩෙංගු බෝවන ස්ථාන පවතින කාණු පද්ධතිය ක්‍රමවත් ලෙස ඉදිකිරීම සිදු කල යුතු බව පවසා සිටි අතර තුඹගොඩ නැෂනල් ගරාජය පිටුපසින් ඇති කාණුවක් හා බෝක්කුවක් නිසා විශාල ලෙස ඩෙංගු අවධානම වැඩි වී ඇති බවත්, එහි අයිතිකරු විසින් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් නොගන්නේ නම් සභාව මැදිහත් වී එම කාණුව කඩා ඉවත් කිරීමට කඩිනමින් කටයුතු කරන ලෙසත් පවසා සිටින ලදී.
තව දුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ඕලුගංතොට සුගත් කඩේ අසල ඇති කාණු පද්ධතිය පවිත්‍රකර දීම සම්බන්ධයෙන් නගර සභාව මැදිහත් වී නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කරන මෙන් ඉල්ලා සිටි අතර සුදර්ශනගම මාර්ගය තාර යොදා පිළිසකර කරදීම හා හුණුකුඹුර දෙල්ගස්වත්ත මාර්ගයේ අබලන් වී ඇති කොටස් පිළිසකර කිරීම යන නඩත්තු යෝජනා කඩිනමින් ඉටුකර දෙන මෙන් මෙහිදී ඉල්ලා සිටින ලදී.
සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05ඃ03 ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා***

05ඃ03ඃ01 කොටුගොඩැල්ල ගමට පිවිසීමට ඇති මාර්ගයේ කැඩීබිඳී ගිය කොටස් නැවත පිළියෙල කිරීම

05ඃ03ඃ02 කොටුගොඩැල්ල උඩවත්ත මහතාගේ නිවස අසල කැඩී ඇති කාණු පද්ධතිය පිළියෙල කිරීම

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කොටුගොඩැල්ල ගමට පිවිසීමට ඇති මාර්ගය කැඩීබිඳී ගොස් ඇති බැවින් එය නැවත යථා තත්වයට පත් කිරීම සඳහා නගර සභාව මැදිහත් වී මාර්ග සංවර්ධන අධිකාරියේ සහාය ලබාගැනීම සඳහා ක්‍රියා කරන මෙන් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ඉන් අනතුරුව එහි ඉදිරි සංවර්ධන කටයුතු සිදුකර දෙන මෙන් පවසා සිටි අතර කොටුගොඩැල්ල උඩවත්ත මහතාගේ නිවස අසල කැඩී ඇති කාණු පද්ධතිය කඩිනමින් සකස් කිරීමට අවශ්‍ය කටයුතුද කඩිනමින් සිදු කරන ලෙස මෙහිදී පවසා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු උප සභාපති එම්.ටී.එම්.රූමී මැතිතුමන් විසින් කොටුගොඩැල්ල උඩවත්ත මහතාගේ නිවස අසල කැඩී ඇති කාණු පද්ධතිය සකස් කිරීම නඩත්තු යෝජනා යටතේ කඩිනමින් සිදු කරන ලෙස වැඩ අධිකාරී වෙත උපදෙස් ලබාදෙන බව පවසා සිටින ලදී.

සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05ඃ04 ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය***

05ඃ04ඃ01 බලන්ගොඩ පෞද්ගලික පංති පවත්වන ස්ථානවල සනීපාරක්ෂක කටයුතු සොයාබැලීම

05ඃ04ඃ02 බලන්ගොඩ බස් නැවතුම්පලේ උඩු මහලේ සනීපාරක්ෂක කටයුතු පිළිබඳ දැනුවත් කිරීම

05ඃ04ඃ03 කරවිකැටිය ප්‍රධාන පාර නඩත්තු කටයුතු නිමවීමෙන් පසු අතුරු පාරවල් සඳහා කාණු පද්ධතිය පිළිසකර කර දීම

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් බලන්ගොඩ පෞද්ගලික පංති පවත්වන ස්ථානවල සනීපාරක්ෂක කටයුතු පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂක ලවා නිරීක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටි අතර, පෞද්ගලික පංති සඳහා සහභාගී වන ගැහැණු දරුවන් මෙම තත්වයන් නිසා මහත් පීඩාවට ලක්ව සිටින බවට කරුණු දැන ගැනීමට ලැබුන බවත් පවසා සිටින ලදී.

එමෙන්ම, බලන්ගොඩ බස් නැවතුම්පලේ උඩු මහලේ සනීපාරක්ෂක කටයුතු සම්බන්ධයෙන් එහි වෙළදුන් අපහසුතාවයට පත්ව සිටින බවත් එම තත්වයන් නිවැරදි කිරීම සඳහා ගරු සභාවේ අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය කරව්කැටිය ප්‍රධාන පාර නඩත්තු කටයුතු නිමවීමෙන් පසු අතුරු පාරවල් සඳහා පස්වලින් වැසී ඇති කාණු පද්ධතිය පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.එමෙන්ම එම මාර්ගයන්හි කසළ එක්රැස් කිරීම සඳහා ට්‍රැක්ටර් නොයැමේ ගැටළුව තවමත් විසඳී නැති හෙයින්, ඒ සඳහා අත් කරත්ත හෝ යෙදවීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදී.
සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින්,කරව්කැටිය මාර්ගයේ නිදාම් හාජියාර් මහතාගේ නිවෙස අසළ පස් දමා ඇති කොටසේ පස් ඉවත්කර කරව්කැටිය මාර්ගයේ ස්ලැබ් දැමීම සඳහා ඉතිරි කරන ලද කොටස් සඳහා ස්ලැබ් දමා වැඩ නිමකර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

බලන්ගොඩ පෞද්ගලික පංති පවත්වන ස්ථානවල සනීපාරක්ෂක කටයුතු සම්බන්ධයෙන් එම මධ්‍යස්ථාන අයිතිකරුවන් ගෙන්වා දැනුවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම සුදුසු බව ගරු උප සභාපතිතුමන් විසින් මෙහිදී පවසා සිටින ලදී.

***05:05 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා***

05:05:01 ගොරොක්ගහමඩ බෙතල්හිල් මාවත අලුත්වැඩියා කිරීම.

ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ගොරොක්ගහමඩ බෙතල්හිල් මාවත අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා මෙම මාර්ගය කන්ද උඩ ප්‍රදේශයට ගමන් කිරීමට ඇති මාර්ගයක් බැවින් විශේෂ උනන්දුවක් යොදවා කඩිනමින් ඉටුකර දෙන ලෙස පවසා සිටි අතර ෆලීල් හාජියාර් මාවතේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් ස්තුති වන්ත වන බව පවසා සිටින ලදි.

සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:06 ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය***

05:06:01 දූනට කසළ එකතු කිරීමට සඳහා ට්‍රැක්ටර් ගමන් කළ නොහැකි මාර්ගවල කසළ එකතු කිරීමට තට්ටුව සහිත ත්‍රීරෝද රථයක් සභාව මගින් ලබාගැනීම

ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද දූනට කසළ එකතු කිරීමට සඳහා ට්‍රැක්ටර් ගමන් කළ නොහැකි මාර්ගවල කසළ එකතු කිරීමට තට්ටුව සහිත ත්‍රීරෝද රථයක් සභාව මගින් ලබාගැනීම සුදුසුයි යන යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් කසළ ට්‍රැක්ටර් ගමන් කිරිම අපහසු බව පවසමින් බොහෝ මාර්ගයන්හි ගමන් නොකිරීමට විකල්පයක් ලෙස මෙවැනි ක්‍රියා මාර්ගයක් ගැනීම සුදුසු බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් අදහස් දක්වමින් තමන් විසින්ද මෙම ගැටළුව සම්බන්ධයෙන් මීට පෙර සභාවාරයන්හිදීද කථාකල බවත් උඩකන්ද හා කරව්කැටිය ප්‍රදේශවල කසල ට්‍රැක්ටරය ගමන් කල හැකි ස්ථානවල පවා මෙම

ට්‍රැක්ටර් රථ නොපැමිණෙන බවට චෝදනා නැගෙන හෙයින් ගරු සභාවේ අවධානය මේ සඳහා යොමුකරන මෙන් මෙහිදී ඉල්ලා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් අදහස් දක්වමින් කසළ ට්‍රැක්ටරය රාස්සගල මාර්ගයේ හා පෙර ගමන් කරන ලද යම් යම් මාර්ගයන්හි ගමන් නොකරන බවත් මේ පිළිබඳව ගරු සභාවේ අවධානය යොමුකරන ලෙසත් පවසා සිටින ලදී. ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය මෙහිදී අදහස් දක්වමින් සුදර්ශනගම ඉහළ මාර්ගයේ නොදිරන ද්‍රව්‍යය එක්රැස් කරන ට්‍රැක්ටරය ගමන් කරන මුත් කසළ ට්‍රැක්ටරය ගමන් නොකරන බවට මහජනතාව චෝදනා නඟන බව පවසා සිටි අතර මස්සැන්න මාර්ගයේද කසළ සම්බන්ධයෙන් විශාල ගැටළුවක් පවතින බැවින් ඒ පිළිබඳව සුදුසු පියවරක් කඩිනමින් ගන්නා මෙන් මෙහිදී ඉල්ලා සිටින ලදී.

මේ සම්බන්ධව පිළිතුරු ලබාදුන් ගරු උප සභාපතිතුමන් විසින් මෙම ගැටළු සම්බන්ධයෙන් ඉදිරියේදි සෞඛ්‍යය කමිටුවට හා කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කර ඉක්මන් තීන්දුවක් ගැනීම සුදුසු බව පවසා සිටින ලදී.
සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ හෙයින් ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩි. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:07 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා***

05:07:01 බුලත්ගම දෙමළ විද්‍යාල මාවත පළමු අතුරු මාර්ගයේ රූපසිංහ මහතාගේ නිවස අසළ කාණුව සංවර්ධනය කිරීම

05:07:02 පල්ලෙවෙල වෙල අද්දර මාර්ගය ඉදිරියේ දී ක්‍රමවත්ව සංවර්ධනය කරන තෙක් ගමන් කිරීමට පහසු වන සේ තාවකාලිකව නඩත්තු කිරීම
ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරනලද යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරනලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් බුලත්ගම දෙමළ විද්‍යාල මාවත පළමු අතුරු මාර්ගයේ රූපසිංහ මහතාගේ නිවස

අසළ කාණුව සංවර්ධනය කිරීම හා පල්ලෙවෙල වෙල අද්දර මාර්ගය ඉදිරියේ දී ක්‍රමවත්ව සංවර්ධනය කරන තෙක් ගමන් කිරීමට පහසු වන සේ තාවකාලිකව නඩත්තු කිරීම යන යෝජනා මේවන විට සභා වාර 8 කදී පමණ සාකච්ඡා කර ඇති නමුදු මේවන තෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ඒ වෙනුවෙන් සිදු නොකල පව පවසා සිටින ලදී.

ගරු උප සභාපතිතුමා විසින් මෙහිදී මේ සඳහා කඩිනම් පියවර ගැනීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05ඃ08 ගරු නාගරික මන්ත්‍රිනි එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය***

05ඃ08ඃ01 බළන්ගොඩ උඩ ඇල්ලෙපොල මූකලන්වත්ත පාර කඩිනමින් සංවර්ධනය කිරීම

ගරු නාගරික මන්ත්‍රිනි එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද බළන්ගොඩ උඩ ඇල්ලෙපොල මූකලන්වත්ත පාර කඩිනමින් සංවර්ධනය කිරීමේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි කේ.ජී.පේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනි එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය බළන්ගොඩ උඩ ඇල්ලෙපොල මූකලන්වත්ත මාර්ගය මෙන්ම ලොකු වලවල් සෑදී ඇති මහමෙව්නා මාර්ගයත්,උඩ ඇල්ලෙපොල වැවේගෙදර මාර්ගයේ අඩි 10 ක පමණ ප්‍රමාණයත් කඩිනමින් සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

ගරු උප සභාපතිතුමා විසින් මෙහිදී බළන්ගොඩ උඩ ඇල්ලෙපොල මූකලන්වත්ත මාර්ගයේ සංවර්ධන කටයුතු හැකි ඉක්මනින් ඉටුකර දෙන මෙන් වැඩ අධිකාරිතුමා වෙත උපදෙස් ලබාදෙන බව පවසා සිටින ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.01.31 දින /2019.02.11 පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 16,299,478.59 |
| වෙනත් ලැබීම් | 1,223,832.09 |
| මුලු ලැබීම් | 17,523,310.36 |
| පුනරාවර්ථන වියදම් | 9,253,818.92 |
| වෙනත් වියදම් | 2,479,718.48 |
| මුලු වියදම් | 11,733,538.40 |

ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.

2019 -02-01 සිට 2019-02-28 දක්වා

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 227-5020 | 26,145.00 |
| 227-5020 | 11,124.00 |
| 56-1906 | 12,870.00 |
| BC-0005 | 10,695.00 |
| BC-0005 | 10,300.00 |
| DDR0008 | 990.00 |
| DDR0008 | 2,060.00 |
| GC 0001 | 3,580.00 |
| GC 0001 | 1,230.00 |
| GK-1483 | 6,435.00 |
| GK-6227 | 13,365.00 |
| GK-6227 | 16,572.00 |
| JD-4684 | 1,032.00 |
| LL-2110 | 7,598.00 |
| LL-7688 | 11,948.00 |
| ND-5124 | 11,124.00 |
| ND-5124 | 5,445.00 |
| OS-0006 | 1,290.00 |
| OV/M0017 | 2,460.00 |
| PF-4006 | 9,373.00 |
| PF-4006 | 15,369.00 |

| | |
|---|---|
| QL-2901 | 984.00 |
| QL-2901 | 3,096.00 |
| RB-4786 | 14,850.00 |
| RB-4786 | 5,150.00 |
| RC-1107 | 5,036.00 |
| RC-1107 | 9,270.00 |
| RC-1118 | 11,490.00 |
| RC-1118 | 20,600.00 |
| RE-2600 | 20,085.00 |
| RD-8000 | 5,871.00 |
| RC - 8183 | 8,910.00 |
| RD-8240 | 13,965.00 |
| RD-8240 | 12,360.00 |
| UQ - 1933 | 1,230.00 |
| UQ - 1933 | 1,290.00 |
| SDRR 0013 | 2,060.00 |
| 226-7521 | 5,940.00 |
| 226-7521 | 6,180.00 |
| YG-0758 | 1,935.00 |
| ZA - 5039 | 18,035.00 |
| ZA-5039 | 28,840.00 |
| **එකතුව** | **378,182.00** |

## 08. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා**

කර්මාන්ත කමිටුවේ සභාපතිවරයා ලෙස තමන්ව පත්කරන ලද සියළු දෙනාට ස්තුතිවන්ත වන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින්, මේවන විට කරව්කැටිය මාර්ගයේ සැලකිය යුතු ප්‍රමාණයක ඉදිකිරීම් කටයුතු නිම කර ඇති බවත්,ෆලීල් හාජියාර් මාර්ගයේ වැඩ අවසන් කර ඇති බවත්,බැංකියවත්ත කාණු පද්ධතිය 95%ක පමණ ප්‍රමාණයක් සකස්කරමින් පවතින අතර,බළගහමුළ නාන ළිඳ අසළ පිලිසකර කිරීම් කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

එමෙන්ම කසළ රැස්කරන ට්‍රැක්ටරය දනට ගමන් කල හැකි මුත් ගමන් නොකරන මාර්ගයන් සඳහා ඉදිරියේදී යොදවනු ඇතැයි බලාපොරොත්තු වන බව පවසා සිටි ගරු

නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින්, කර්මාන්ත කමිටුවේ සභාපති වශයෙන් අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය යටතේ,ජී.චන්ද්‍රලතා මැතිතුමිය හා සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් පවසා සිටින ලද සංවර්ධන කාර්යයන් දෙක කඩිනමින් ඉටු කිරීමට බලාපොරොත්තු වන බව පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දක්වා සිටි ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේදි නගරය ආශ්‍රිත පදිංචිකරුවන් සඳහා සාධාරණයක් ඉටුකර දෙන මෙන් ඉල්ලා සිටි අතර, දවස් 52 ක ආණ්ඩු විරෝධි විප්ලවය නිසා සංවර්ධනයට වෙන් කරන ලද මුදල් ඇහිරී ගිය අතර මේවන විට එම මුදල් නැවත ලැබෙමින් පවතින හෙයින් ඉදිරියේදි සංවර්ධන කාර්යයන් සාර්ථකව නිම කල හැකි බව පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී අකිල සාළිය එල්ලාවල මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී අකිල සාළිය එල්ලාවල මැතිතුමා අදහස් දක්වමින් මාර්තු මස 31 වෙනිදා ශ්‍රී සුදර්ශනගම විහාරස්ථානයේ විහාරාධිපති ගරුතර පියනන්ද ස්වාමීන් වහන්සේ හට එම නිකායේ ප්‍රධාන අනුනායක ධූරය ලැබීමට නියමිත බවත් එදින එම උත්සව අවස්ථාව සඳහා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් සහභාගී වන අතර, දිවා ආහාරය සඳහා කිරිදිගල වටරවුම් පාරේ නිවෙසක් වෙත යාමට නියමිත බැවින් එම යනෙන මාර්ගය අළුත්වැඩියා කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.එමෙන්ම හිටපු ජනාධිපතිවරයෙක් මෙන්ම ශ්‍රේෂ්ඨ නායකයෙක් වන මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත සිදු කරන ගරු කිරීමක් ලෙස ඒ පිළිබඳව සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

මාළිගාතැන්න කුෂන් කඩය අසළ මාර්ගයේ සංවර්ධන කටයුතු හා දෙණියකුඹුර සුමිත් මහතාගේ නිවෙස අසළ මාර්ගයේ සංවර්ධන කටයුතු නතර කර ඇති බවට දැනගැනීමට ලැබුන බවත් සභාවේ සියළු දේ සම්මත වූ පසු එසේ සංවර්ධන කටයුතු නතර කිරීම පහත් අසික්කිත ක්‍රියාවක් සේ හෙළා දකින බවත්,සභාව යුධ පිටියක් බවට පත්කර ගෙන ක්‍රියා කිරීමට අවශ්‍ය නැති අතර, ඒ තත්වයට සභාව වට්ටවා ගැනීමට කටයුතු කිරීම හොඳ ක්‍රියාවක් නොවන බවත් මෙහිදී පවසා සිටින ලදී.

නගර සභාවේ මහජනයා සමග ගැටෙන නිළධාරීන් වශයෙන් වැඩ අධිකාරී හා මහජන සෞඛ්‍යය පරීක්ෂක යන දෙදෙනා ඉතා කාර්යක්ෂම විය යුතු බවත් එසේ නොවුන විට,වැඩ මන්දගාමී වන අතර ජනතා සේවය පසුබසින අතර නිළධාරීන් වශයෙන් ශීඝ්‍රයෙන් ක්‍රියාත්මක විය යුතු බවත් මෙය ඉතා කනගාටුදායක තත්වයක් බවත් පවසා සිටින ලදී.

එමෙන්ම නිරන්තරයෙන් අධිභාරයට බයෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය නැති බවත්, ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව විසින් බෙලිහුල් ඔය පාෂාණ දමා වෙනස් කිරීම සම්බන්ධව උදාහරණ ගෙනෙමින් පෙන්වා දුන් ගරු නාගරික මන්ත්‍රී අකිල සාළිය එල්ලාවල මැතිතුමා විසින් ඊට වඩා ප්‍රබල ආයතනයක් ලෙස නගර සභාව ප්‍රබල හා කාර්යක්ෂම විය යුතු බව පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවළ මැතිතුමන් විසින්, සභාව සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට නොහැකි නම් හා ඉදිරිපත් කරනු ලබන යෝජනා ක්‍රියාත්මක නොකෙරේ නම්,ඵලක් නොවන බව පවසා සිටි අතර මෙම සභාවෙන් මහජනතාව සඳහා වැසිකිළි පෝච්චියක් ලබාදීමට තරම්වත් මුදල් ලබාදේ යැයි බලාපොරොත්තු විය නොහැකි බවත් පවසා සිටින ලදී.

බලංගොඩ මූලික රෝහල ඉදිරිපිට කඩ සම්බන්ධයෙන් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවළ මැතිතුමන් විසින් රෝහලේ වෛද්‍ය අධිකාරිය හා මාර්ග සංවර්ධන අධිකාරියේ බලපෑම මත එම කඩ ඉවත් කිරීම නිසා එම ව්‍යාපාරිකයන් අසීරුතාවයට පත්ව ඇති බවත්, මේවන තෙක් කාණු පද්ධතිය ආවරණය කර තිබූ ස්ලැබ් කොටස් යථා පරිදි සකස් නොකිරීම නිසා එම ස්ථානයේ අනතුරුදායක තත්වයක් පැනනැගී ඇති බැවින් සභාවේ අවධානය යොමු කරන මෙන් පවසා සිටිනලදී.

බලංගොඩ මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය අක්‍රිය වීම සම්බන්ධයෙන් මෙහිදී අදහස් දක්වමින් මෙය පළාත්සභාවේ ගැටළුවක් බැවින් ගරු අධිකරණ අමාත්‍ය තළතා අතුකෝරාල මැතිතුමියට මෙම වගකීමෙන් හා යුතුකමෙන් කිසිසේත් බැහැර විය නොහැකි බව පවසා සිටි අතර, රෝහල් කමිටුවේ වගකීම් කරට ගෙන ක්‍රියා කිරීම

සම්බන්ධයෙන් සමනළ ව්‍යාපාරයේ අධිපතිතුමාට ස්තුතිවන්ත විය යුතු බව පවසා සිටින ලදී.

එමෙන්ම තමන් විසින් පවත්වන ලද කථාවේ සියළුම දේ සභා වාර්තාවේ අන්තර්ගත කරන ලෙස පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින්, නගරයේ සුනබ ප්‍රශ්නය පිළිබඳවද සභාවේ අවධානය යොමු විය යුතු බවත්,කිසිඳු කාර්යක්ෂමතාවයක් හා කිසිඳු ක්‍රමානුකුලත්වයක් නැති මෙම සභාව පිළිබඳව කනස්සල්ලෙන් පසුවන බවත් පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් අදහස් දක්වමින්, වැසි දිනයන්හි රාස්සගල මාර්ගය ගඟක් බවට පත්වන තත්වයකට පත්වී ඇති බැවින් මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කොට මෙම තත්වයන් ක්‍රමානුකුල කිරීම සඳහා සභාවේ අවධානය යොමු කරන ලෙස පවසා සිටින ලදී.

එමෙන්ම රාස්සගල මාර්ගයේ පිවිසුම අසළ තුඹගොඩ මංසන්ධියේ තිබූ මගී නැවතුම් ස්ථානය ඉවත් කිරිම හේතුවෙන් පාසල් ළමුන් හා මගීන් අව් රශ්මියෙන් හා වැස්සෙන් ඉතා අපහසුතාවයට පත්වන බවත්,මේ සම්බන්ධයෙන් කඩිනම් පියවරක් ගැනීම සභාව සතු කාර්යයක් බවත් පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් වැලිහරනාව මාර්ගයේ තවමත් සංවර්ධන කටයුතු ආරම්භ නොවුනු බව පවසා සිටි අතර, කන්දෙ පන්සල නිසාවෙන් අනඳමෙත්ගම මාර්ගයේ අවුරුදු දිනයන්හි හා වෙසක් පොහොය දිනයන්හි විශාල ජනකායක් සැරිසරන බැවින් එම මාර්ගයේ සංවර්ධන කටයුතු කඩිනමින් නිමා කර දෙන මෙන් මෙහිදී ඉල්ලා සිටින ලදී.

**එමෙන්ම** බලංගොඩ මූලික රෝහල ඉදිරිපිට කාණු පද්ධතිය ආවරණය කර තිබූ ස්ලැබ් කොටස් මේවන තෙක් යථා පරිදි සකස් නොකිරීම නිසා එම ස්ථානයේ ඉතා අවදානම්කාරී තත්වයක් උද්ගත වී ඇති බැවින් ඒ සම්බන්ධව සභාවේ කඩිනම් අවධානය යොමු කරන මෙන් පවසා සිටින ලදී.පසුගිය වර්ෂයන්හි වර්ෂය ආරම්භ වන විට ගරු මන්ත්‍රීවරුන් වෙත සභාවෙන් දින පොත් මුද්‍රණය කර ලබාදුන් අතර මෙම වර්ෂයේ එසේ කිසිවක් නොලැබුනු බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විශ්ව විද්‍යාල සඳහා සුදුසුකම් ලද දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහන කඩිනම් කරන ලෙස පවසා සිටින ලදී.

<u>**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා**</u>

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් රෝහල් ගොඩනැගිල්ලට පිටුපස වාහන නැවතුම් පළක් සකස් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතින බවත් ඊට දක්වන සහයෝගයක් වශයෙන් නගර සභාව මගින් සංවර්ධන කටයුතුවලදී ඉවත්කරන පස් එම ස්ථානය කරා ගෙන ගොස් දමන මෙන් ඉල්ලා සිටි අතර, රෝහල ඉදිරිපිට කාණුව ආවරණය කර තිබූ ප්ලේට් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කොට නැවත සකස් කර දෙන ලෙසද ඉල්ලා සිටින ලදී.

එමෙන්ම, නගර සභා සෞඛ්‍යය අංශයේ සේවකයන් මගින් සභාවේ මාර්ගවල ප්ලේට් කැඩෙන තත්වයක් දක්නට ලැබෙන බවත්, මස්සැන්න මාර්ගයේ හා බුද්ධ ජයන්ති මාර්ගයේ ජේ.සී.බී. යන්ත්‍රය ධාවනය නිසා කොන්ක්‍රීට් කැලි කැඩී ඇති බවට නිරීක්ෂනය වූ බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා මේ සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුවිය යුතු බව පෙන්වා දෙන ලදී.

නගරයේ පෞද්ගලික වාහන නැවතුම් ගාස්තු අයකිරීමේදි කිසිදු ප්‍රමිතියකින් තොරව ටිකට්පත් ලබාදීමේ අවස්ථා දක්නට ලැබෙන පව පැවසූ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා අදාළ ටෙන්ඩර්කරු මේ පිළිබඳව දැනුවත් කල යුතු බව පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා විසින් පළමු වසරට පාසල් ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධව අදහස් දක්වා සිටි අතර,24/2018 චක්‍රලේඛයට අනුව පදිංචිය සඳහා ලකුනු 30 ක් ලබාදීමේ ක්‍රමවේදය යටතේ බොහෝ වෙනස්කම් සිදු වූ බවත් මේ පිළිබඳව අධ්‍යයනය කරන විට ගැටළුසහගත තත්වයන් පෙනී යන බවත් මෙම ගැටළු සඳහා නියමාකාර විසඳුම් සෙවීමට නම් නව අධ්‍යාපන ක්‍රමයක් හා නව චක්‍රලේඛ අණපනත් අවශ්‍ය වන බවත් පවසා සිටින ලදී.

අධ්‍යාපනයෙන් විස්ථාපනය වන දරුවන් සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා දුර සිට නගරයට දරුවන් පාසල් කරා පැමිණීමට හේතුව ගමේ පාසලේ ගුරුවරුන් නොමැතිකම බවත් මෙම විෂමතාවයන් අඩුකිරීමට කිසිදු ආණ්ඩුවකට හැකියාවක් නොමැති බවත් පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමන් විසින් රටේ ජනතාවගේ සෞඛ්‍යය පිරිහීමට හේතුව මිනිසාට ඇති වී තිබෙන සමාජ හා ආර්ථික ප්‍රශ්න බවත් ඉන් ඇති වී තිබෙන ආතතිය බවත් පවසා සිටි අතර රටේ පවතින මත්ද්‍රව්‍යය , අල්ලස් ගැනීම්, අධිකරණ තීන්දු ලබාදීම් හා දූෂන වංචා සම්බන්ධව පැහැදිලි කිරීමක් සිදුකර අතර සියළු ගැටළු අවසානයේ රෝගීන් හා උන්මත්තක ජනතාවක් රටේ ඉතිරිවනු අතැයි පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය**

විදුලි බල අධිකාරිය විසින් වීදි පහන් පිලිබඳව සභාව හරහා දැනුවත් කිරීමක් සිදු කරන ලෙස පසුගිය සභාවේ සිදුකරන ලද සාකච්ඡාවේ දී දැනුම් දුන්නද මේ වන තෙක් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය,උඩකන්ද මාර්ගයේ මේ සම්බන්ධව විශාල ගැටළුවක් පවතින හෙයින් සභාවේ අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම බලංගොඩ මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය අක්‍රිය තත්වයේ පැවතීම සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය, මේ සම්බන්ධයෙන් ගරු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරන අමාත්‍ය තළතා අතුකෝරාල මැතිතුමිය හමුවී සාකච්ඡා කල බවත්, එතුමිය මේ සඳහා මැදිහත්වී මෙම ගැටළුව ක්‍රමානුකූලව විසඳීමට එකඟ වූ බවත් පවසා සිටින ලදී.

## ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් ගොරොක්ගහමඩ බෙතල්හිල් මාවත අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටි අතර, ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් පෙන්වා දුන් සභාවේ අඩුපාඩු ඇත්ත බවත් එම අඩුපාඩු ඉදිරියට ගෙන නොගොස් කඩිනමින් නිවැරදි කරගත යුතු බවත් පවසා සිටින ලදී.

රත්නපුර දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා වැඩිම මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබී ඇත්තේ බලංගොඩ නගරයට බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා බලංගොඩ මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය අක්‍රිය තත්වයේ පැවතීමේ ගැටළුව සඳහා ගරු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරන අමාත්‍ය තළතා අතුකෝරාල මැතිතුමිය මැදිහත්වෙන බවට පවසා සිටි බව පවසන ලදී.
ෆලීල් හාජියාර් මාවතේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ස්තුතිවන්ත වන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා බලංගොඩ මුස්ලිම් දරුවන්ට අධ්‍යාපනය ලැබීමට ඇති එකම පාසල වන ජෙයිලානි ජාතික පාසලට ගරු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරන අමාත්‍ය තළතා අතුකෝරාල මැතිතුමියගේ මැදිහත් වීමෙන් විශාල මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබී ඇති බවත්, අන් කිසිවෙකුත් ඒ සම්බන්ධව ලකුනු දමා නොගත යුතු බවත් පවසා සිටින ලදී.

## ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සිය අදහස් දක්වමින් සභාවට යෝජනා ලබාදීමට ප්‍රමාද වූ හෙයින් න්‍යාය පත්‍රයට ඇතුළත් කර ගැනීමට නොහැකි වූ නිසා එම යෝජනා මුදල් කමිටුවට ඉදිරිපත් කර ඉටුකර දෙනු ඇතැයි බලාපොරොත්තු

වන බව පවසා සිටි අතර,වෙළෙඳ සංගමය මගින් ඔරලෝසු කනුව ප්‍රතිසංස්කරනය කරදීමට බලාපොරොත්තු වන බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

**නගරයේ ඉදිකිරීම් සම්බන්ධව අනුකූලතා සහතිකය ලබාගැනීමේදි ව්‍යාපාරිකයන් බොහෝ සේ දුෂ්කරතාවයන්ට පත්වන බවත් ණය පහසුකම් ලබාගැනීමට නොහැකිව ආර්ථික අපහසුතා සඳහා මුහුනදෙන බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී** ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් හිටපු සභාපතිතුමන්ගේ කාල වකවාණුවේ මෙවන් දුෂ්කරතා නොවූ බවත් ඒ සඳහා ස්තුතිවන්ත වන බවත් පවසා සිටින ලදී.

**වාහන නැවතුම්පලවල් සම්බන්ධව කරුණු දැක්වූ ගරු නාගරික මන්ත්‍රී** ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් කොමර්ෂල් බැංකුව ඉදිරිපිට ත්‍රි රෝද රථ නැවතුම්පළ පුවරුව හා වාහන නැවැත්වීම තහනම් පුවරු එක ළගින් ස්ථාපිත කර ඇති බවත්,ලංකාවේ හොඳම නගර සභාවක් ලෙස මෙවැනි වැරදි පූර්වාදර්ශ සම්බන්ධව ලැජ්ජ විය යුතු බව පවසා සිටින ලදී. එමෙන්ම කොමර්ෂල් බැංකුව ඉදිරිපිට පදික කඩ ඉවත් කර අවුරුදු සමයේ වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සඳහා ලීසිං ආයතන වෙත ලබාදීම සුදුසුද යන්න විමසා සිටි අතර එසේ ඉඩ දෙනු ලබන්නේ නම් සභාව දැනුවත් කරන මෙන් පවසා සිටින ලදී.

**නව වරිපනම් තකසේරුව සම්බන්ධව කරුනු විමසා සිටි ගරු නාගරික මන්ත්‍රී** ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් පොලිසිය ඉදිරිපිට ,ජෙම් ෂූ පැලස් ආයතනය අසල හා නගරයේ ඇතැම් ස්ථානවල කාණු දුගදින් යුතු බැවින් ඒ සම්බන්ධව සභාවේ අවධානය යොමුකරන ලෙසත් ඩෙංගු ව්‍යාපෘතිය යටතේ බැංකු පිටුපස කාණු පවිත්‍රකිරීම් සිදුකරන ලෙසත් පවසා සිටිනලදී.

බලංගොඩ මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය සඳහා සිංහ සමාජය මගින් සිදු කරනලද සේවය පිලිබඳව කරුණු දක්වා සිටි ගරු **නාගරික මන්ත්‍රී** ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් හදිසි මරන පරීක්ෂක තනතුරේ පුරප්පාඩුව සම්බන්ධයෙන් කඩිනම් පියවරක් ගත යුතු බවද පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් අදහස් දක්වමින් සභාව නියෝජනය කරන කාල වකවාණුව තුළ උප සභාපතිවරයෙකුට සභාව

මෙහෙයවීමට ලැබෙන්නේ කළාතුරකින් වන බවත් එම අවස්ථාව ලද ගරු උප සභාපතිතුමන්ට සුබ පතන බවත් පවසා සිටින ලදී.

එමෙන්ම සභාපති වශයෙන් ගන්නා තීන්දු සභිකයන් දහසය දෙනා ඉක්මවා නොයාවී යැයි අපේක්ෂා කරන බවත් අද දින සභාව තුල ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමන් වෙතින් ඉතා කාලෝචිත හා ප්‍රායෝගික කථාවක් අසන්නට ලද බවත්, පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් විවෘත ආර්ථිකය සමඟ වැලඳගත් බොහෝ දේ නිසා රටේ පාසල් පද්ධතිය හා ඊට පරිබාහිර බොහෝ දේ වෙනස් වූ බව මෙහිදී පවසා සිටින ලදී.

ලංකාවේ දූෂනයක් නොමැති එකදු ආයතනයක්වත් නොමැති බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් ග්‍රාම නිළධාරින්ගේ වැරදි ලියාපදිංචි ක්‍රමවේද නිසා ප්‍රාදේශිය සභා,නගර සභා මාරු වී ඡන්ද ලියාපදිංචි වී ඇති බවත් මිනිසුන්ට සිදුවන මෙවන් අසාධාරන තත්වයන් කඩිනමින් නිවැරදි විය යුතු බවත් පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දක්වා සිටි ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් සභාවේ සමිතී මගින් කොන්ත්‍රාත් කිරීමෙන් පසුව චෙක්පත ලබා ගැනීමට යාමේදි එම චෙක් පතින් 1% ක ප්‍රමාණයක් සුභ සාධන සමිතියට ඉල්ලා සිටීමේ ක්‍රමවේදයට විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත්, සිමෙන්ති මිල ඉහළ ගොස් ඇති කාල වකවාණුවක අසරණ සමිති වලින් එසේ මුදල් ගැනීම වැරදි බවත් මන්ත්‍රිවරුන්ද තම දීමනාවෙන් මෙම සුභ සාධක සංගම් සඳහා මුදල් ලබාදෙන බවත් මෙහිදී පවසා සිටින ලදී.

ලංකාවේ හොඳම පළාත් පාලන ආයතනය,හොඳම ඝන අපද්‍රව්‍යය මධ්‍යස්ථානය හා හොඳම පුස්තකාලය ලෙස පසුගිය කාල වකවානුවේ සම්මානයට පාත්‍ර වූ බලංගොඩ නගර සභාව මේවන විට මිනුවන්ගොඩ පුස්තකාලය නැරඹීමට යාමට තරම් තත්වයකට පත් වූයේ මන්දැයි විමසා සිටි ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් 2002-2006 කාල වකවාණුවේ දක්නට ලැබුන අසාර්ථක

නගර සභාවක ලක්ෂණ මේ කාලය තුලද දක්නට ලැබෙන බවත් 2018 වර්ෂයේ සිට ඉදිරියට අසාර්ථක නගර සභාවක් බවට පත්වෙන ලක්ෂණ සභාවේ ගරු මන්ත්‍රිවරුන්ගේ අදහස් දැක්වීම් තුළින් තව දුරටත් සනාථ වන බවත් පවසා සිටින ලදී. සභාවේ බලය ලබාගැනීමේදි වැරදි සිදුවීම් වුන අතර බලය ලබාගත් පිරිස් එම කාර්යයන් හරි හැටි නොකිරීම එම පක්ෂයේම සාමාජිකයන්ගේ අදහස් දැක්වීම් තුළින් ප්‍රකාශ වන බවත්,තම පක්ෂය නැවත බලයට පැමිණි පසුව සභාව නැවත සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් අදහස් දක්වමින් තම පක්ෂය නියෝජනය කරනු ලබන ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් අද දින සභාව මෙහෙයවීම සම්බන්ධව සතුටට පත්වන බවත් 2020 වර්ෂයේදි මෙම පුටුව වෙනස්කිරීමේ බලාපොරොත්තුවෙන් පසුවන බවත් පවසා සිටින ලදී.

මහජන බදු මුදල් එකතු කරමින් සභාවේ කාර්යයන් කළමණාකරනය කර ගැනීමට නොහැකි පරිසරයක් තුළ වැඩ බැරි ආණ්ඩුවක් සේම මෙය වැඩ බැරි නගර සභාවක් ලෙස පෙන්වා දීය හැකි බව පවසා සිටි අතර,සභාවේ සෑම කමිටුවකම එක්සත් ජාතික පක්ෂයේ සභිකයන් වැඩිපුර නියෝජනය කරනු ලබන බවත් පවසා සිටින ලදී.

මාර්ග නඩත්තු සැලස්මට අනුව වර්ෂ අවසානයේ සිදු කිරීමට ඇති බැංකියවත්ත මාර්ගය වැනි සංවර්ධන යෝජනා මේ වන විට ආරම්භ කර ඇති බව පවසා සිටි ගරුනාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් බලංගොඩ මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය අක්‍රිය වීමේ ගැටළුව හා බලංගොඩ වාහන නැවතුම්පලක් ඉදිකිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සභාව අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කරන බවත් සභාව නියෝජනය කරනු ලබන මන්ත්‍රිවරුන් 16 දෙනා වෙතම සංවර්ධන කාර්යයන් සඳහා ඉඩ ලැබිය යුතු බව පවසා සියින ලදි.එමෙන්ම අදෝනා අසන්නට නොමැති නව රජයක් හා නව සභාවක් 2020 වර්ෂයේ බලයට ගෙනඒමට බලාපොරොත්තු වන බව නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් වැඩිදුරටත් පවසා සිටින ලදී.

**09. අවසානය**

ගරු උප සභාපතිතුමන් විසින් මෙහිදී අදහස් දක්වමින්, අද දින තමන් කෙරෙහි විශ්වාසය තබමින් සභාවේ මෙහෙයවීමේ කාර්යය භාර දුන් ගරු සභාපති චමික ජයමිණි විමළසේන මැතිතුමන්ට බෙහෙවින් ස්තුතිවන්ත වන බව පවසා සිටි අතර සභාවේ කාර්යයන් කරගෙන යාමට සහය දක්වූ සියළුම දෙනාට තම ස්තුතිය පිරිනමන පව පවසා සිටින ලදී.

සභාවක් ලෙස කණ්ඩායම් හැගීමෙන් ක්‍රියා කර බලංගොඩ මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය විවෘත කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමුයි පවසා සිටි ගරු උප සභාපතිතුමන් විසින් හදිසි මරණ පරීක්ෂකවරයෙක් ලබාදෙන මෙන් ඉල්ලා මේවන විටත් ලිපි ඉදිරිපත් කර ඇති අතර කඩිනමින් එම ගැටළුව නිමා වේ යැයි අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

සභාවේ සංවර්ධන කටයුතු සම්බන්ධව ගැටුම් ඇතිකර නොගෙන සියළුදෙනා සහයෝගයෙන් ජනතා සේවය උදෙසා ක්‍රියා කරමුයි පවසා සිටි ගරු උප සභාපතිතුමන් විසින් පක්ෂයේ තීන්දු අනුව තමන් රාජකාරි කිරීමට බැදී සිටින බවත් පවසා සිටින අතර මෙදින සභාවේ වැඩ කටයුතු සාර්ථකව සිදු කර ගැනීමට සහය දක්වූ සියළු දෙනාට ස්තුතිවන්ත වන බව පවසමින් ප.ව.3.00 ට පමණ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

එම්.ටී.එම්.රුමි,

උප සභාපති,

බලංගොඩ නගර සභාව.